**කැළෑ දෙපාර්තමේන්තු අරමුදල - 2017**

**------------------------------------------------**

කැළෑ දෙපාර්තමේන්තු අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කැළෑ ආඥා පනතේ (451 අධිකාරිය) 64 වගන්තිය යටතේ සාදනු ලැබූ රෙගුලාසිවල අංක 10-ඊ දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැළෑ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.13,049,342 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.17,414,389 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,365,047 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව තෑගි ප්‍රදාන, පුහුණු වියදම්, වෙනත් ගෙවීම් හා උසාවි දඩ මුදල් ගෙවීම් පිළිවෙලින් රු.3,440,796, රු. 1,483,792, රු.1,302,805, රු.353,153 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

2009 අංක 65 දරන කැලෑ (සංශෝධන) පනතේ 64 (ඇ)(1) වගන්තිය ප්‍රකාරව වන අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් නීතිය ඉදිරියට පමුණුවන ලබන වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සහ ඔත්තු සපයන්නන්ට ත්‍යාග මුදල් ලබාදීම, සාක්ෂිකරුවන්ට සහ නිලධාරීන්ට උසාවි ගමන් සඳහා වියදම් ගෙවීම සහ කැළෑ නිලධරයන්ට ස්වකීය කර්තව්‍යයන් කාර්යක්ෂමව කරගෙන යාම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ඇතුළු වන සංරක්ෂණ කටයුතු කිරීමට වියදම් දැරීම අරමුදලේ මූලික අරමුණු වේ.

අරමුදලේ ආදායම් සහ වියදම් පිළිබඳව සලකා බැලීමේදි පසුගිය වර්ෂයේ ආදායමින් වැයකර තිබුණේ සියයට 53 ක් වන අතර සමාලෝචිත වර්ෂයේ ආදායමින් වැයකර තිබුණේ සියයට 65 ක් පමණි. මේ අනුව විගණනයට නිරීක්ෂණය වුයේ සෑම වසරකම ආදායමින් වැඩි ප්‍රමාණයක් වැයකර නොතිබූ බවය.

### 4.2 ලැබිය යුතු ආදායම්

-----------------------

උසාවි මඟින් අයකරගත් මුදල් කැළෑ අරමුදලට බැර කිරීමට ප්‍රමාදවීමක් සිදුවී තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් එකතුව රු. 5,501,500 ක් විය. ඒ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයන් 03 ක ඇස්තමේන්තු වියදමින් සියයට 12 සිට සියයට 49 ක් දක්වා වූ පරාසයක ඉතිරියක් පැවතුණි. ක්‍රමානුකූල වැය පරිපාලනය කිරීම මෙම ඉතිරියට හේතුව ලෙස කළමනාකාරීත්වය දක්වා තිබුණද, වාර්ෂිකව අඛණ්ඩව සැලකිය යුතු ඉතිරියක් පැවතීම නිසා අයවැය ඇස්තමේන්තු නිවැරදි පදනමක් මත සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර වන සංරක්ෂක ජනරාල් වෙත දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ආදායම් පාලනය | උසාවි මඟින් අය කර ගන්නා දඩ මුදල් අප්‍රමාදව දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) අය වැය පාලනය | නිවැරදිව අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබීම. |